# සත්‍ය දර්ශනය පිළිබඳ බෞද්ධ සංකල්පය

සේනානන්ද භික්ෂු

ලොව ආගම් හා දර්ශනයන්ට ඇත්තේ දීර්ඝ ඉතිහාසයෙකි. වෛදිකයුගයේ පටන් බෞද්ධයුගය දක්වා භාරතයේ පහළ වූ ආගම් හා දර්ශනවාද රාශියෙකි. එම විවිධ ආගම් හා දර්ශනයන් පිරික්සීමේ දී බුද්ධාගමය දඹදිව පහළ වූ අලෞකික සිතුවිලි පරපුරෙක අග්‍රඵලය ලෙස සැලකිය හැකි ය. ක්‍රිස්තු පූර්ව සවැනි සියවසේ දී ලොවට අසහාය විමුක්තිමාර්ගය හෙළිකළ ගෞතම බුදුරජානන්වහන්සේ පහළ වූ සේක. එම අසිරිමත් සිදුවීම නිසා අනාදිමත් කාලයක් තුළ යුගයෙන් යුගයට පරිණාමයට පත්වෙමින් ආ භාරතීය චින්තනධාරාව නිදහසේ පැතිර ගියාය.

පෙර'පර දෙදිග ආගම් විෂයෙහි මූලික කරුණු දෙකක් ඉස්මතු වී පෙනේ. එනම්, ලෝකනිර්මාපක දෙවියකු පිළිබඳ විශ්වාසය හා මනුෂ්‍ය ශරීරයේ ස්ථිර - නොනැසෙන ආත්මයක් ඇතැයි යන විශ්වාසය යි. මේ දෙ මතයන්හි එල්බගත් ආගම් එය පදනම් කොට ඔවුන්ගේ ආගමික මති මතාන්තර ගොඩනගා ඇත. ඉහාතමයේ ම සියලු සැප පතන චාර්වාක වැනි උච්ඡෙදවාදය හැරෙන්නට ලෝකනිර්මාපක දෙවියකු පිළිබඳ විශ්වාසයත් සන්තානගත ආත්මය පිළිබඳ විශ්වාසයක් බැහැරකළ එකම ආගම බුද්ධාගමය යි. අනාත්ම දර්ශනය එහි හරය වශයෙන් සැලකීම නිවරද ය. බුද්ධාගමය ගොඩනැගී ඇත්තේ ත්‍රිලක්ෂණය නමැති ධර්මන්‍යායය පදනම් කරගෙන ය. සර්වබලධාරී දෙවියකු හෝ දේව දෘෂ්ටියක් හෝ නො පිළිගත් බුදුරදහු යම් දෙවියෙක් ජීවත් වන්නේ නම් ඔහුද අනිත්‍ය බැව් වදළහ. මෙසේ බුදුදහම භාරතීය ආගම් හා දර්ශනයන් අතර අමුතු ම මුහුණුවරක් ගත්තේ එය පුද්ගලයන්ගේ සැනසීම උදකර ගැනීමට මහ පෙන්වන ශ්‍රේෂ්ඨ ධර්මමාර්ගයක් වන බැවිනි.

තත්කාලීන සමාජක්‍රමයට පටහැණි චින්තන මාර්ගයක් අනුගමනය කළ සිද්ධාර්ථ ගෞතම බෝසතාණන් වහන්සේ ස්වතන්ත්‍ර ව ම සත්‍යය අවබෝධ කළසේක. මධ්‍යමප්‍රතිපදව සසරින් එතෙරවීමට ඒකායන මාර්ගය ලෙස පෙන්වා දුන් එකම ශාස්තෘ වරයාණෝද බුදුරජාණන් වහන්සේ ය. පන්සාලිස් වසරක් මුළුල්ලේ බුදුරදුන් වදළ ධර්මය අප්‍රමාදය ම මුල්කරගත් නිවෘත්ති මාර්ගය හෙළිකරන්නකි. දෙලෝ ශුභ සිද්ධියට හේතුවන උපදෙස් එහි ඇතුළත් වන අතර හැම බුදුවදනක ම ගැබ් වී ඇත්තේ විමුක්ති රසය යි. භක්තියට හෝ අන්ධ විශ්වාසයට එහි කිසිදු ඉඩක් නැත. අවිචාරාත්මක ව යමක් පිළිගැනීමට බුදුදහම සම්පූර්ණයෙන් ම විරුද්ධ ය. 'ධර්මය නුවණැත්තන් සඳහා මිස අනුවණයන් සඳහා වූවක් නොවේ.' බුදුදහම ආගම - දර්ශනය

යන කවර නමකට වුව ද ගැළපෙනුයේ එය සත්‍යය පදනම් කරගත් ධර්මයක් වන බැවිනි.

ස්වභාව ධර්මයා කෙරෙහි මිනිසා තුළ වූ ඉමහත් බිය නිසා නොයෙක් ආගම් පහළ වීමත් සමග ම විවිධ දර්ශන ලොව පුරා පැතිරිණ. පෙර දිගින් භාරතය දර්ශනයට ආකරයක් බඳු ය. අපරදිගින් පුරාණ ග්‍රීසිය ද එවැනි ය. නොයෙක් උපක්‍රමශක්තීන්ගේ මාර්ගයෙන් විවිධ මත ඉදිරිපත් කරමින් ඒවා තර්කානුකූලකර ශක්තිමත් කිරීමට තැත්කළ ඇතැම් ආගමික නායකයින් හා දර්ශනවාදීන් නිසා ඒ ඒ ආගම් හා දර්ශනවල සාරයේ වැදගත්කම අහෝසි විය. කිසියම් මතයක් හෝ දර්ශනයක් හෝ ශක්තිමත් කිරීමට බාහිර උපක්‍රම ශක්තීන්ගේ පිටුවහල අනවශ්‍ය ය. බාහිර බලවේගයන් අවශ්‍යවන්නේ නම් එහි කිසියම් දුර්වලතාවක් නිසා විය යුතු ය. ඇතමුන් මහත් අභිමානයෙන් පිළිගන්නා 'ශුෂ්කතර්කක්‍රමය' මිනිසාගේ නිදහස් චින්තනය මුවහ කරන්නකි. විද්‍යාඥයාගේ දර්ශනපථය ඉක්ම වූ බොහෝ දේ සිතේ දියුණුව ඇත්තාට දතහැකි ය. එහෙත් විද්‍යාත්මක පර්යේෂණවලට හසු නොවන සියල්ලක් ම නැතැයි කීම සාවද්‍ය ය. ඇතැම් ආගමික ඉගැන්වීම් නවීන විද්‍යාව ඉදිරියේ නො බබළතත් බුදුදහමේ සියලු ප්‍රකාශයක් ම පාහේ විද්‍යාව නිසා තහවුරු වන්නේ එම සත්‍ය දර්ශනයේ බලමහිමය නිසා ම ය.

**සත්‍යය සත්‍යයෙන්ම ප්‍රකට වේ:-**

ආගම ධර්මය තර්කානුකූල දර්ශනයක් කරන්නේ නම් එය බොහෝ දුරට සත්‍යයෙන් තොර වූවකි. සත්‍යයට බාහිර උපකාරකධර්මයන්ගේ පිටුවහල අනවශ්‍ය ය. සත්‍යභාවය ම දර්ශනය විය යුතු ය. කිසියම් පුද්ගලයෙකුට සත්‍යය අවබෝධ කරවීමෙහි ලා බුදුරදුන් ධර්මය උපයෝගී කරගත්තේ නවීන විද්‍යාඥයන් සේ පර්යේෂණ පවත්වමින් නොවේ. කාලාන්තරයක් තිස්සේ කළ පර්යේෂණවල ප්‍රතිඵලයක් වශයෙන් පෘථිවියේ ගෝලාකාර බව සොයාගත් භූ විද්‍යාඥයාට සෙස්සනට එය අවබෝධකරවාදීමට සුදුසු ග්‍රහනයක් ඇතිවන තෙක් වර්ෂ ගණනක් බලා සිටීමට සිදුවිය. එහෙත් නුවණැතියෙකුට සත්‍යාවබෝධ කරවීමට බුදුරදුන්ට දින ගණනක් හෝ අවශ්‍ය නො විය. ධර්ම දේශනාව මැදදී හෝ අවසන්හි හෝ ධර්මය අවබෝධවීමට තරම් ධර්මයේ සත්‍යභාවය ගැබ් විය. ඇතැම්විට මිථ්‍යා දෘෂ්ටිකයකු ලෙස බුදුරදුන් වෙත පැමිණෙන්නා බැහැරව යන්නේ සම්‍යක් මාර්ගයට පිළිපන්නකු ලෙස ය. එසේ ධර්මයඅවබෝධ කළවුන්ගේ හද තුළින් මතුවූ ප්‍රීතිවේගාත්මක උදාන ත්‍රිපිටකයේ සුලභය. සූත්‍රපිටකයේ හැම සූත්‍රාවසානයක ම පාහේ එම ලක්ෂණය දක්නට ඇත. බොහෝ සූත්‍රවල දක්වෙන, "අභික්කන්තං භන්තෙ - පෙ - උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණංගතන්ති" යන ප්‍රීතිවාක්‍යයෙන් හා ඇතැම් සූත්‍රවල දක්වෙන, "මනං වතභො අනස්සාම -පෙ- සුපටිපන්නො සඞ්ඝොති[1]" යන ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ බුද්ධ ධර්මයේ ජීවමාන සත්‍යභාවය යි. ස්වක්ඛාත වූ ධර්මය තමා විසින් ම ප්‍රත්‍යක්ෂ කළ පසු අමන්දානන්දය මෙසේ ප්‍රීති වේගයෙන් ප්‍රකට කිරීමෙන් ධර්මය හා පුද්ගලයා අතර පවත්නා සමීප සම්බන්ධය මැනවින් හෙළි වේ.

මිනිසාගේ චින්තන ශක්තිය දියුණුවන්නා හාම මානව සමාජයේ විවිධ වෙනස්කම් ඇති විය. පරම්පරානුගත ව හෝ ආගමානුකූල ව හෝ සමාජයේ මුල් බැසගෙන පැවති සිතුවිලි හා ඇදහිලිවලට මෙ මගින් බලවත් ප්‍රහාරයෝ එල්ල වූහ. පෙරදිග මෙන් ම අපරදිග ආගම් විෂයෙහි ද මේ ලක්ෂණය දක්නට ඇත. ශුෂ්කතර්කය මත රඳා පැවති එබඳු ආගම් චින්තන විපර්යාසයනට විරුද්ධ විය. අපරදිග ආගමික ක්ෂේත්‍රය ගැන විමසනවිට විශේෂයෙන් ක්‍රිස්තියානි පූජකයෝ දේවධර්මයට විරුද්ධ අදහස් දක්වමින්

පරිණාමවාදයට අනුව සත්ත්වගණයාගේ උපත සිදුවිණා'යි විස්තර කළ චාල්ස් ඩාර්වින් හා පෘථිවියේ භ්‍රමණය හා පරිභ්‍රමණය ගැන විස්තර කළ ගැලලියෝ වැනි විද්‍යාඥයන්ට විරුද්ධ වූහ.[1] තවද ප්‍රජාතන්ත්‍රවාදයේ නිජ බිම ලෙස සැලකෙන පුරාණ ග්‍රීසියේ නිදහස් සිතුවිල්ලකට කිසිසේත් ඉඩක් නො වූ බවට සාධක එමට ය. ආචීර්ණ කල්පික ආගමික මතයන්ට විරුද්ධ ව අභීතලෙස සිය අදහස් පළකළවුන් අතර වූ ඊලියාතු දර්ශනනිකායේ ආරම්භකයා ලෙස පිළිගැනෙන සීනෝ fපැනිස් දරුණු වධයට පත් කෙරිණ.[2] සොක්‍රටීස් අධිකරණයෙන් තීරණය වූ මරණීය දණ්ඩනය පිළිගෙණ වස පියල්ල සියතින් ම පානය කර දිවි හානිකර ගත්තේ ය.[3] ප්‍රොට-ගෝරස් අදේව වාදියෙකැ'යි පණ පිටින් හංවඩුගසා රටින් නෙරපා ඔහුගේ පොත්පත් ද ගිනි දෙවියාට පුදන ලදී.[4] මෙබඳු සිද්ධීන්ගෙන් හෙළිවන්නේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් තිබූ පමණින් ම නිදහස් සිතුම් පැතුම්වලට ඉඩ නො ලැබී ඇතිබව යි.

ලොව ස්වභාවධර්මය පිළිබඳ සෑහෙන අවබෝධයක් ලැබීමෙන් ද සත්‍යගවේශකයාට ආගම ධර්මය පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීමට පහසු වෙයි. සෑම විද්‍යාත්මක සොයාගැනීමක් ම පරීක්ෂණයේ හා නිරීක්ෂණයේ ප්‍රතිඵලයෝ ය. ඒ හැම එකක් ම මනුෂ්‍ය බුද්ධියේ බලයෙන් මිස සර්වබලධාරී දෙවිකෙනෙකුන්ගේ බලවත් කමකින් වී යැයි පිළි ගැනීම උගහට ය. මනුලොව පවත්නා නානාවිධ ශාස්ත්‍රයන් ද ආශ්චර්ය ජනක යන්ත්‍ර සූත්‍රාදිය ද මිනිසාගේ දැඩි උත්සාහය හා අත්හදබැලීම් වලින් ක්‍රමයෙන් දියුණු වූ දේ බවට මානව ඉතිහාසය සාක්ෂි දරයි.

එහෙත් මනුෂ්‍යඥානය ඉතා උසස් තත්ත්වයට පත්වීමට අදළ හේතුප්‍රත්‍යය මනුලොව මිස දෙව්ලොව ඇති බවක් නො හැඟේ. මේ අනුව මනුෂ්‍යඥානය දිව්‍යඥානය ද අබිබවා යන්නකියි සැලකීම නිවරද ය. බුද්ධත්වය පවා මනුෂ්‍යයකුට මිස දෙවියකුට හෝ බ්‍රහ්මයකුට හෝ නො ලැබිය හැකිබැව් බුද්ධධර්මයෙන් පැහැදිලිවන නිසා මනුෂ්‍ය බුද්ධියේ ශ්‍රේෂ්ඨත්වය ඔප්පු වන්නේ ය.

**දේව වරමක් උඩ නො වේ::-**

සත්‍යදර්ශනය හෙවත් සත්‍යාවබෝධය පිළිබඳ බෞද්ධ සංකල්පය විමසීමේ දී බුදුරජාණන් වහන්සේ ගැනත් උන්වහන්සේ විසින් ලොවට ඉදිරිපත් කළ ධර්මය ගැනත් සිත් යොමුකිරීම අවශ්‍ය මැයි. 'ධර්මය දකින්නා බුදුරදුන් දකී. බුදුරදුන්දකින්නා ධර්මය දකී' - යනුවෙන් වදරා ඇත්තේ ධර්මය හා ශාස්තෘවරයාණන් අතර පවත්නා අන්‍යෝන්‍ය සම්බන්ධතාව යි. තමන් මිනිසකු මිස අන් කිසිවකු නො වන බවත් මනුෂ්‍ය බුද්ධියෙන්ම සත්‍යාවබෝධය කළබවත් ඍජුව ප්‍රකාශ කළ එකම දර්ශනිකයා තථාගතයන් වහන්සේ බව උන්වහන්සේගේ ශ්‍රී මුඛපාඨවලින් ම[6] හෙළිවේ. සෙසු ශාස්තෘවරු තමා ඊශ්වරයා හෙවත් දෙවියන් වහන්සේම ය. නැතහොත් ඔහුගේ අවතාරය හෝ ඔහු විසින් මෙහෙය වනු ලැබුවෝ'යයි කියා ගත්හ. බුදුරදහු තමා කිසියම් දෙවියකු විසින් හෝ අන්කිසි බාහිර බලවේගයකින් මෙහෙයවනු ලැබුවෙකැ'යි කිසිවිටක නො පැවසූහ.

"Buddhist, in fact, is the adult among religionists, all others are children with respect to their god. And beg just as children. The buddhist is the only one who seeks the truth, regardless of aught else."

*Dr. Paul Dahlke*

"බුද්ධාගම්කාරයා වනාහි ලොව ආගම්කාරයන් අතුරෙන් එකම තලතුනා පුරුෂයා වේ. දෙවියන් කෙරෙහි පවත්නා විශ්වාසය හේතු කොට ගෙන අනෙක් ආගම්කාරයෝ ළදරුවන් හා සමාන වෙති. ඔවුහු ළදරුවන් මෙන් යාච්ඤා කරති. පිටතින් (දේව) පිහිටක් බලාපොරොත්තු නොවන එකම තැනැත්තා බුද්ධාගම්කාරයා වේ."[7]

(පෝල් ඩාල්කේ පඬිතුමා)

බෞද්ධ දර්ශනය පිළිබඳ පර්යේෂණ පැවැත් වූ විවිධ උගතුන් අතර පෝල් ඩාල්කේ පඬිතුමාගේ මෙම ප්‍රකාශය විශේෂයෙන් අනුස්මරණය කළ යුත්තකි. පෝල් වැනි අපරදිග බොහෝ උගතුන් බුද්ධාගමය උසස් ආගම වශයෙන් ලොවට හඳුන්වා දී ඇත්තේ එහි පවත්නා ජීවමාන සත්‍යභාවය තමන් තේරුම්ගත් අයුරින් සෙස්සනට ද ප්‍රකාශ කිරීම වශයෙනි.

සත්‍යදර්ශනයෙහි ලා බුද්ධිය මෙන් ම ස්වතන්ත්‍රභාවයත් අවශ්‍ය ය. සත්‍ය ගවේශකයාට ඇති බාධක අතර මුල් තැනක් ගන්නේ අසත්‍ය දර්ශනයන්ට යටත්වීමට සිදුවීම යි. ඇතැම්විට විවිධ ඉගැන්වීම් අනුගමනය කරන්නා අවුල් ජාලයකට මුහුණදෙයි. ඔහුට සත්‍යාසත්‍ය භාවය වෙන වෙනම තේරුම් ගැනීමට පවා නො හැකිතරමට අවුල් වෙයි. බුඩකාලීන භාරතීය සමාජය ද මෙබඳු විය. එද දර්ශනය වරදවා තේරුම් ගත් ඇතැම් ශාස්තෘන් නිසා නො මග ගිය සත්‍ය ගවේශකයන්ගේ ගණන ඉමහත්ය. සිඩාර්ථ ගෞතම බෝධිසත්වයන් වහන්සේ **'කිං කුසල ගවෙසී' කිං සච්ච ගවෙසී'** වූයේ මේ නිසා ම ය. බුදුරජාණන් වගන්සේ අත් දැකීමෙන්ම සත්‍යාවබෝධය සඳහා ස්වාධීනත්වය, ස්වච්ඡන්දතාව (Free Will) අවශ්‍ය බැව් වදළේ එබැවිනි. 'තමාට පිහිට තමා ම ය, අන් පිහිටක් නැත.'[8] 'තමන් පිහිට කොට වෙසෙව්, අනුන්ගේ පිහිට නොපතව්, ධර්මය පිහිට කොට වසව්, අනුන්ගේ පිහිට නො පතව්[9] මෙබඳු ඉගැන්වීම්වලින් පුද්ගලිකත්වයට හා සත්‍යයට මුල්තැන දී ඇති බැව් පැහැදිලි වේ.

සත්‍යය යනු, කිසිලෙසකින් හෝ වෙනස් නො වන ධර්මය බලයෙකි. මනෝමය වූ එම සත්‍යය අවබෝධ කිරීමෙහි ලා ස්වාධීනත්වය අවශ්‍ය වෙයි. තම බුද්ධියත් වීර්යයත් ඉවහල් කරගෙන සියලු බැඳුම් වලින් මිදීමේ ශක්තිය මිනිසා සතුව පවත්නාබව් බුදුරජාණන්වහන්සේ ප්‍රකාශ කළ සේක. ඒ සඳහා මග දක්වන්නෝ බුදුවරයෝ ම ය. ඔබ ඔබගේ කොටස කළ යුතුය. තථාගතවරු මාර්ගය දක්වන්නෝය[10] යන ප්‍රකාශයෙන් ද ඒ බැව් හෙළි වේ.

''මගේ ධර්මය විශ්වාස කළ යුතුය. නැතහොත් ඔබ නරකයට යවන්නෙමි.'' කියා හෝ ''මගේ ධර්මය විශ්වාස කළ පමණින් පුදපූජා පැවැත්වූ පමණින් යාච්ඤා වලින් ඔබ ස්වර්ගයට යවන්නෙමි, මොක්ෂය ලබා දෙන්නෙමි'' කියා හෝ අයුතු පිළිසරණක් බුදුරදුන්ගෙන් පැවැසී නැත. බුදුරදුන් මාර්ග දේශකයකු මිස ගැලවුම් කාරයකු නොවන බැවිනි. සත්‍යය සැඟවීමක් තථාගතවරුන් තුළ නැත. තමන් අවබෝධ කළ ධර්මය එපරිද්දෙන් ම ලොවට හෙළි කිරීම බුද්ධවංශයේ චාරිත්‍ර ධර්මයක් වන බැවිනි.

'ශ්‍රේෂ්ඨතම බෞද්ධ ඉගැන්වීම් අතර නිදහස් චින්තනය තරම් සිත් ගන්නක් ආගමික ඉතිහාසයේ ම නැති තරම්ය.[11] තමාම සත්‍යය අවබෝධ කිරීමෙන් විනා දෙවියකු විසින් පිරිනමන දයාමය ආශීර්වාදයක පිහිටෙන් මිනිසකුට දුකින් මිදිය නොහැකි බැවින් මේ නිදහස අත්‍යවශ්‍යක බව බුදුරදුන් බොහෝ අවස්ථාවලදී වදරා ඇත.

මජ්ඣිම නිකායේ: වීමංසක සූත්‍රය, චූල්ල හත්ථිපදෝපම සූත්‍රය, අලගද්දූපම සූත්‍රය, ගෝපක මොග්ගල්ලාන සූත්‍රය, උපාලි සූත්‍රය, අපණ්ණක සූත්‍රය ද,

අඞ්ගුත්තර නිකායේ: කාලාම සූත්‍රය ද, දීඝ නිකායේ: මහාපරිනිබ්බාන සූත්‍රය ද ඉන් කීපයෙකි.

**ස්වාධීන විමර්ශනය:** බුදුරජාණන් වහන්සේ විසින් කාලාම ගොත්‍රිකයන්ට වදරනලද ධර්මපර්‍යායය[12] පුද්ගල නිදහසේ අගය මැනැවින් තහවුරු කරන්නෙකි. විවිධ ශාස්තෘවරුන්ගේ අනුශාසනාවලින් මුළා වී සිටි ඔවුනට 'ශ්‍රේෂ්ඨ ධර්මය මගේ ය'යි නො වදරා කිසිදු ඉගැන්වීමකට යටත් නොවී තමන්ගේ ම වැටහීමට අනුව සත්‍යය හා අසත්‍යයද, කුසලය හා අකුසලය ද

තීරණය කළ යුතු බව උන්වහන්සේ වදළ සේක. මහා පරිනිබ්බාන සූත්‍රයේ සඳහන් වන මහාපදේස විවරණයේදීද එම නිදහස ම දී ඇත්තේ මතභේද සහිත කරුණක දී යථා තත්ත්වය පරීක්ෂා කිරීම ධර්ම විනය ඇසුරින් තමාම කළයුතු බැවිනි. දේව බලයකට අදෘශ්‍යමාන නිර්මාතෘවරයකුගේ බලයට යටත් ව එතෙක් පැවැති මිනිස් සිතුවිලිවලට පැහැදිලි පිළිතුරු ලැබුණේ බුදුරදුන්ගේ මෙබඳු සානුකම්පික ඉගැන්වීම් වලිනි. වෙන දෙයක් තබා ශ්‍රාවකයන් විසින් බුදුරදුන් ගැන පවා විමසා බැලීමට හැකි බව විමංසක සූත්‍රයෙන් හෙළිවේ. **''පරසිත් නො දන්නා විමසන භික්ෂුව විසින් තථාගතයන් වහන්සේ සම්‍යක් සම්බුද්ධ ද? නැද්ද''යි දැන ගැනීමට තථාගතයන් වහන්සේ පිළිබඳ විමසා බැලිය යුතු''**[13] යනුවෙන් වදරා ඇත.

යමක් පිළිබඳ නො විමසා දුටුපමණින් හෝ ඇසූ පමණින් 'එය එසේය'යි තීරණය කිරීමට ඉක්මන් නො වියයුතුය. හදිසියේ ගන්නා තීරණ වැරදීමට හැකි බැවිනි. විද්‍යාත්මකව යමක් පරීක්ෂාකර බලනවිට එහි යථාතත්ත්වය වැටහෙන තෙක් එසේ තීරණය නො කෙරේ. මේ අනුව බෞද්ධ පර්යේෂණ ක්‍රමය විද්‍යාත්මක ආකල්පයට (Scientific Attitude) ද වඩා බොහෝ දුරට ගියේ වෙයි. එය නූතන බුද්ධි විකාශනයේ ජයග්‍රහණයෙකි. ලොව බොහෝ දෙනකුන් අදහන වේදය, බයිබලය, කෝරාණය වැනි අන්‍යාගමික ඉගැන්වීම් එලෙසින්ම පිළිගත යුතු විනා බුද්ධියෙන් විමසීමට ඉඩෙක් නැත.

විචිකිච්ඡාව හෙවත් සැකය සත්‍යාවබෝධයට හා අධ්‍යාත්මික දියුණුවට අතිශය බාධාකර ධර්මයෙකි. එසේ ම යම් කරුණක් පැහැදිලි ව තේරුම් ගන්නා තෙක් සැකය තුරන් නො වනබව ද පැහැදිලිය. සැකයෙක් නිදහස් විය හැක්කේ පැහැදිලිව දැකීමෙන් හෝ තේරුම් ගැනීමෙන් පමණි. සැක නැති කිරීම පිළිබඳ බුදුහු හැමවිටම මහත් සැළකිල්ලක් දැක්වූහ. තමන් වදළ ධර්මය ගැන කිසියම් විමතියක් ශ්‍රාවකයන් තුළ ඇතොත් තමන්ගෙන් ප්‍රශ්න කළ යුතු බවද පිරිනිවන් පෑමට මොහොතකට පෙර පවා තම ශ්‍රාවකයනට දන්වා වදළහ. ශ්‍රාවක පිරිස නිහඬවූවිට බුදුරදුන් වදළේ 'ඔබ ප්‍රශ්න නො අසන්නේ ශාස්තෘවරයා කෙරෙහි ගෞරවය නිසා නම් යහළුවකුගේ මගින් හෝ ඉදිරිපත් කළ යුතුය යනුවෙනි. අනවශ්‍ය ශාස්තෘ ගෞරවය පවා බුදුරදුන් නො පිළිගත්තේ ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ ධර්මාවබෝධයම අගය කළ බැවිනි.

බුදුරදුන් තමා ගැන වුව ද විමසීමට අවසර දී තිබියදී ධර්මය ගැන මතුවන ගැටලුවකදී සැක පහළ කිරීමට ඇතැමුන් දක්වන භීතිය අස්ථානභීතියෙකි. යමක් විමසීමට ලක් කරන්නේ එහි සත්‍යා'සත්‍යය පැහැදිලි කර ගැනීමට මිස එය අවඥවට ලක් කිරීමට නො වියයුතුය. ලොව කොපමණ ආගම් හා දර්ශන විද්‍යමාන වුවත් 'සත්‍ය ධර්මය' නම් එකක්ම බැවින් ගැටලු නිරාකරණය කර ගැනීම එම පවිත්‍ර ධර්මයේ ව්‍යාප්තියටත්, ශාස්තෘ ගෞරවයටත් බොහෝ දෙනාගේ හිතසුව සඳහාත් පවත්නේ මැයි. එයින් ශාස්තෘවරයාට හෝ ධර්මයට හෝ අල්පමාත්‍රවූද අගෞරවයක් හෝ අනර්ථයක් නොවනු ඒකාන්ත සත්‍යයෙකි.

---

1. මජ්ඣිම නිකාය (89) ධම්මචේතිය සුත්ත.
2. ලක්දිව බෞද්ධ සභ්‍යත්වය 3 පරි: 49 පිට
3. ආදි ග්‍රීක දර්ශනය (අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනය) 57 පිට
4. බටහිර දර්ශන (පරවාහැර පඤ්ඤානන්ද ථෙර) 22 පිට
5. ග්‍රීක දර්ශනය 96 පිට
6. අංගුත්තර නිකාය (4. 1. 4. 6) දෝණ සුත්ත
7. මිනිසාට ආගමක් අවශ්‍යද? 1 පරි. 4 පිට
8. ධම්මපද (12) අත්තවග්ග 4 ගාථාව
9. දීඝනිකාය – මහා පරිනිබ්බාන සුත්ත
10. ධම්මපද (20) මග්ගවග්ග 4 ගාථාව
11. බුදුන් වදළ ධර්මය 1 පරි: 3 පිට
12. අංගුත්තර නිකාය : කාලාම සුත්ත (3. 2. 2. 5)
13. මජ්ඣිම නිකාය:විමංසක සුත්ත